# බොලිවියාවේ ඓතිහාසික පණත් කෙටුම්පත පිටුපස මිහිමවගේ නීතිය

*නික් බක්ස්ටන් විසින් ලියන ලදී*

2011 *අප්‍රියෙල් 24 දින* YES ! *සඟරාවෙනි*

බොලිවියාවේ සම්මත කරගැනීමට අපේක්ෂා කරන නව නීතියක් මගින් එරට ආර්ථිකය හා සමාජය මුළුමනින්ම පාරිසරිකව නව දිශාවකට යොමුකිරීමේ බලය ලබාදෙනු ඇත.

බොලිවියානු ඇන්ඩියන් දේශයේ ස්වදේශිකයින්ගේ හා කුඩා ගොවීන්ගේ ව්‍යාපාරයන් විසින් සමස්ථ ලෝක ඉතිහාසයෙහි වඩාත්ම පරිසර හිතකාමී පණත් කෙටුම්පතක් සම්මත කරගැනීමට ආසන්නව සිටිති. බොලිවියානු ව්‍යවස්ථාදායක මණ්ඩලයෙහි දැනට විවාද වෙමින් ඇති ''මිහිමවගේ නීතිය'' ස්ථිර වශයෙන්ම සම්මත වීමට ඉඩ ඇත්තේ ආණ්ඩුවේ බහුතර පක්ෂය වන MAS (Movimiento Al Socialismo) පක්ෂය එයට දැනටමත් එකඟතාවය පලකර ඇති හෙයිනි.

මෙම නීතිය ''සොබාදහම ශුද්ධ වූ මාතෘභූමිය ලෙස ( Pachamama - මිහිමව) සලකන ස්වදේශීකයින්ගේ සංකල්පයන්ගෙන් බොහෝ කරුණු උකහාගෙන සකස්වූවකි. අපි ඒ මත සම්පව රැඳී සිටිමු. එම නීතියෙහි ප්‍රකාශිත පරිදි ''මිහිමව යනු සජීවී ගතිකත්වයකින් යුත් පද්ධතියක් වන අතර එය සමන්විත වී ඇත්තේ සියලු ජීවීන් අතර නොබෙදුනු ප්‍රජාවකගෙනි. ඒ සියල්ල එකිනෙක සමග සම්බන්ධව පවතී, එකිනෙකා මත බැඳී පවතී, එකිනෙකට සහයෝගීව ක්‍රියාකරයි ඒ සියල්ල පොදු ඉරණමක කොටස්කරුවෝ වෙති.''

එම නීතිය මගින් සොබාදහමට නීතිමය අයිතියක් ලබාදෙයි. ජෛව විවිධත්වයට, ජලය, පිරිසිදු වාතය, සමතුලිත බව හා ප්‍රතිස්ථාපනයට නීතිමය අයිතියක් ලබාදෙයි. බොලිවියානු නීතිය

විසින් බොලිවියාවේ ආර්ථිකය හා සමාජයට මූලික පාරිසරික නව දිශාගතකරණයකට බලය ලබාදෙයි. ඒ අනුව දැනට ඇති හා අනාගතයේ සම්මත කෙරෙන සියලු නීතිවලට මිහිමවගේ නීතියට අනුව හැඩගැසීමට සිදුවනු ඇත. සොබාදහම විසින් පනවනු ලබන සියලු පාරිසරික සීමාවලට එකඟවීමට සිදුවනු ඇත. සියලු මහජන ප්‍රතිපත්ති Sumaj Kawsay - 'සුමාජ් කවුසේ' විසින් මඟපෙන්වනු ලැබිය යුතුය. ( Sumaj Kawsay යනු 'හොඳින් ජීවත්වීම' යන අරුත ඇති ස්වදේශීය සංකල්පයකි. එනම් සොබාදහම සහ මිනිසා අතර මනා සංහිඳියාවකින් ජීවත් විය යුතුය. දැනට පවතින වඩවඩාත් භාණ්ඩ නිෂ්පාදනය හා පරිභෝජනය දිරිගැන්වීමේ වත්මන් අවධානය වෙනුවට මෙම සංකල්පයට ප්‍රමුඛතාවය ලැබෙනු ඇත.

ප්‍රායෝගිකව, මෙම නීතිය අනුව රජයට අලුත් නොවන සම්පත් වෙනුවට අලුත් වන සම්පත් කරා මාරු වීමට සිදුවේ. සියලු ආර්ථික කටයුතුවල පාරිසරික බලපෑම තක්සේරු කිරීම සඳහා නව ආර්ථික දර්ශකයන් සකස් කිරීමට සිදුවනු ඇත. සියලුම පෞද්ගලික හා රජයේ සමාගම් වල පාරිසරික විගණනයක් කිරීමට සිදුවනු ඇත. ආහාර හා යලි උපදවන බලශක්තිය පිළිබඳ ස්වෛරීභාවය ගොඩනැගීම සඳහා වන ප්‍රතිපත්ති සැකසිය යුතුය. බලශක්ති කාර්යක්ෂමතාවය, පාරිසරික හිතවාදී භාවිතාවන් සහ කාබනික කෘෂිකර්මය සඳහා සම්පත් ආයෝජනය කිරීඹට සිදුවනු ඇත. සියලු සමාගම් හා පුද්ගලයන්ට පාරිසරික අපවිත්‍ර කිරීම් වලට වගකියන්නනටත්, හානි කරන ලද පරිසරයන් යලි ප්‍රතිස්ථාපනය කිරීමටත් නියමවනු ඇත.

මෙම නීතියට අනුග්‍රහ දැක්වීම සඳහා මිහිමවගේ අමාත්‍යංශයක් අලුතින් පිහිටුවනු ඇත. තවද, අන්තර් අමාත්‍යංශ උපදේශක මණ්ඩලයක් සහ ඔම්බඩ්ස්මන් (දුක්ගන්නාරාළ) වරයකු පත් කෙරෙනු ඇත.
දශලක්ෂ 3.5 ක් සාමාජිකත්වය දරණ ගොවි ව්‍යාපාරයක් වන CSUTCB සංවිධානය මෙම නීති කෙටුම්පත සැකසීමට සහායවූ

අතර, එම සංවිධානයේ නායක අන්ඩෙරිකෝ පින්ටෝ (Undarico Pinto) විශ්වාස කරන පරිදි මෙම නීතිගත කිරීම බොලිවියානු නීතියෙහි සුවිශේෂ සන්ධිස්ථානයක් වනු ඇත. ''දැනට පවතින නීති ශක්තිමත් මදි. මේ මගින් කර්මාන්ත වලට වඩා විවෘතභාවයකින් ක්‍රියාකිරීමට සලස්වනු ඇත. ඒ මගින් ජාතික, ප්‍රාදේශීය සහ ස්ථානගත මට්ටම් වලදී ජනතාවට කර්මාන්ත පාලනය කිරීමට ඉඩ සලසනු ඇත.''

එසේ වුවද, බොලිවියාවේ සමාජ ව්‍යාපාර වලට - විශේෂයෙන් ''එක්සත් ගිවිසුම'' (), නමින් රටේ විශාලතම සමාජ ව්‍යාපාරයන් පහක එකමුතුවෙන් හැදුණු ව්‍යාපාරයට මෙම නව නීතිය පැවැත්ම පමණක් මගින් පාරිසරික පලපුරුදුකම් වෙනස් කිරීමට ප්‍රමාණවත් නොවන බවට දැඩි අවබෝධයක් ඇත. මෙම නීතිය පිටුපස සිටි තීරණාත්මක බලවේගයක් වූයේ මෙම සංවිධානය යි.

ප්‍රධාන බාධකයක් වන්නේ බොලිවියාව ව්‍යුහමය වශයෙන් කැනීම් කර්මාන්ත මත රදා පවත්නා රටක් වීමයි. 16 වන සියවසේදී ස්පාඤ්ඤයින් විසින් රිදී සොයාගැනීමේ සිට බොලිවියාවේ ඉතිහාසය ගැටගැසී තිබුනේ පොහොසත් රටවලට ධන සම්පත් ගෙනයාම සඳහා එරට ජනතාව සහ පරිසරය සහාසික ලෙෂ සූරාකෑමත් සමගය. කවියෙකු හා ඉතිහාසඥයකු වන එඩුවාඩෝ ගැලියානෝ (Eduardo Galeano) තම සුප්‍රසිද්ධ පොතක් වූ Open Veins (විවෘත රුධිර නාලිකා) නම් පොතෙහි විශාල වශයෙන් කරුණු දක්වා ඇත්තේ යුරෝපයේ කර්මාන්ත ව්‍යාප්ත කරනු සඳහා කටයුතු කළ ම්ලේච්ඡ ක්‍රියාදාමයන් ගැනය. 2010 දී බොලිවියාවේ අපනයනයන්ගෙන් 70% ක් තවමත් ඛනිජ ද්‍රව්‍ය, ගෑස් සහ තෙල් මත රදා පවතී. මෙම ව්‍යුහමය රදා පැවැත්ම බෙහෙවින් ලෙහා ගැනීමට අපහසු බැදීමකි.

තවද, බලසම්පන්න අංශවල, විශේෂයෙන් පතල් සහ කෘෂිකාර්මික ව්‍යාපාර තුළ තම ලාභ වලට තර්ජනයක් වන කුමණ හෝ පාරිසරික නීති වලට අතිවිශාල විරෝධයක් ඇත. සෝයා නිෂ්පාදකයින්ගේ ප්‍රධාන සංවිධාන මෙම නීතියට

විරුද්ධව දැනටමත් නැඟීසිට ඇති බලසම්පන්න කණ්ඩායම් වලින් එකකි. මෙම නීතිය විසින් ''නිෂ්පාදන ක්ෂේත්‍ර කළ නොහැකි දේ බවට පත්කරනු ඇතැයි'' ප්‍රකාශ කොට ඇත. ආණ්ඩුව තුලමද බොහෝ අමාත්‍යංශ සහ නිලධාරීහු මෙය හුදු දර්ශනය අඩංගු ලියැවිල්ලක් සහ අවසානයේ දී අර්ථයක් නැති ප්‍රකාශයක් ලෙෂ පවතිනු දැකීමට කැමති වනු ඇත.

පැක්ටෝ ඩි යුනිඩෑඩ් සංවිධානයේ උපදේශකයෙක් වන රාවුල් ප්‍රාඩා පැහැදිලි කළ පරිදි බොලිවියාවේ විශාලතම සමාජ ව්‍යාපාරයන් විසින් මිහිමව නීතිය ගොඩනගනු ලැබුවේ MAS රජය විසින් ඔවුන් ප්‍රතිපත්ති සකස් කිරීමෙන් ඉවත්ව තැබීමට උත්සහ කරන බව පෙනීගිය නිසාය. ජනාධිපති ඉවෝ මොරාලෙස් ස්වදේශීක ජනාධිපති වරයෙකි. මෙම සංවිධානය MAS රජය අතිවිශාල ජයග්‍රහණයක් ලැබූ 2005 සිට සාමාන්‍යයෙන් එම රජයට සහයෝගය දක්වා ඇත. එහෙත් ප්‍රගතිය මඳ වීම නිසා යම් කළකිරීමකට ලක්ව සිටිති. මේ පිළිබඳ තම සැලකිලිමත් භාවය ප්‍රකාශකිරීමට පමණක් සීමා නොවු (ප්‍රධාන වශයෙන් ස්වදේශික හා ගොවිතැන් කරන ජනතාවයෙන් සමන්විත) මෙම ව්‍යාපාර - වඩා ක්‍රියාකාරී ලෙස නව නීති ගණනාවක් ගොඩනගමින් සිටිති. ඔවුන්ගේ ප්‍රථම ප්‍රමුඛතාවය වූයේ ''මිහිමව නීතිය'' සම්මත කරගැනීමයි. මෙය 2010 අප්‍රියෙල් මස බොලියාවේ පවත්වන ලද කාලගුණ විපර්යාස පිළිබඳ ඓතිහාසික ලෝක සමුළුවේ දී ඇති කරගත් සම්මුතිය අනුව ගොඩනැගුණකි. පුදුමයකට හේතුවක් වෙමින් විවිධ ව්‍යාපාර ඉක්මනින්ම එකඟතාවයකට පත්වූ අතර MAS නීති සම්පාදකයින් එයට සහාය දැක්වූහ.

රාවුල් ප්‍රාඩා සඳහන් කරනුයේ සමාජ ව්‍යාපාරයන්ගේ සැලකිය යුතු බලපෑමක් සහිතව වුවද Vivir Bien සංකල්පය මත පදනම් වූ ආර්ථිකයකට මාරුවීම එතරම් සහසු නොවන බවයි. කැනීම් මත පදනම් වූ ආර්ථිකයක් වෙනස් කිරීම දුෂ්කර වනු ඇත. අපට වහාම පතල් වසා දැමීම පැහැදිලිවම කළ නොහැක්කකි. එහෙත් ඒ ආර්ථිකයට වඩ වඩාත් අඩු බරක් හා වැදගත්කමක් ලැබෙන

ආකෘතියක් ගොඩනැගිය හැක. ඒ සඳහා ව්‍යාපාරයන්ගේ සහභාගීත්වය ඇතිව ගොඩනැගිය හැක. ඒ සඳහා ව්‍යාපාරයන්ගේ සහභාගීත්වය ඇතිව ගොඩනගන ප්‍රතිපත්ති අවශ්‍යවනු ඇත. විශේෂයෙන් ආහාර ස්වෛරීභාවය වැනි ක්ෂේත්‍රවලදී එය අවශ්‍ය වේ. ඒ සඳහා සංවර්ධනය පිළිබඳ විවිධ පාරිසරික ආකෘතීන් කරා යොමුවූ ප්‍රතිපත්ති අවශ්‍ය වේ. ඒ සඳහා ජාත්‍යන්තර ප්‍රජාවගේ සහයෝගීතාවයෙන් යුතුව එකිනෙකට උපකාරී වන කලාපීය ආර්ථිකයන් ගොඩනැගීම අවශ්‍යය.

අවසන් වශයෙන් මෙය බොලිවියාවට වඩා බෙහෙවින් විශාල වූ අභියෝගයක් වන නමුදු ''අපගේ පාරිසරික හා සමාජ අර්බුදය හුදෙක් බොලිවියාව හෝ ඉක්වදෝරයට පමණක් වූ ප්‍රශ්න නොවේ. එය අප සියල්ලන්ටම ප්‍රශ්නයකි. අපට ජනතාවන්, පර්යේෂකයින් සහ ප්‍රජාවන් එකට අදිමින් සැබෑ නිශ්චිත විකල්පයන් ගොඩනැගීම අවශ්‍යවනු ඇත. එය කළ යුත්තේ දැනට බලසම්පන්නව ඇති සූරාකෑමේ පද්ධතීන් අපගේ අතපසුකිරීම් නිසා දිගටම පැවැතීම වලකාලනු පිණිසය. මෙය පහසු කායයීයක් නොවේ. එහෙත් ජාත්‍යන්තර සහෝදරත්වයෙන් යුතුව අපි සාර්ථක විය යුතුය. සාර්ථක විය හැකිය.

**නික් බ්‍රික්ස්ටන් මෙය YES ! සඟරාවට ලියන ලදී. එය ජාතික ලාභ නොලබන මාධ්‍ය සංවිධානයකි. එය ශක්තිමත් අදහස් ප්‍රායෝගික ක්‍රියාකාරකම් සමග බද්ධ කරයි. ඔහු බොලිවියාවේ වසර 4 ක් ගත කොට සමාජ හා පාරිසරික සාධාරණත්වය සඳහා සටන් කරන ව්‍යාපාර පිළිබඳ අධ්‍යනය කළේය.**

**සරත් ප්‍රනාන්දු**
**2011-04-27**